## මාධ්‍යය ප්‍රකාශය

**JCI ශ්‍රී ලංකා විශිෂ්ඨ තරුණ සම්මාන 2011. සුවිශේෂී දක්ෂතා දැක් වූ තරුණ තරුණියන් සඳහා නාම යෝජනා දැන් භාර ගනු ලැබේ.**

ජූනියර් චේම්බර් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (JCI Sri Lanka) ආයතනය සංවිධානය කරන ශ්‍රී ලංකා විශිෂ්ඨ තරුණ සම්මාන 2011 (Ten Outstanding Young Persons of Sri Lanka Award (TOYP) 2011) 31 වැනි වරටත් 2011, අගෝස්තු මාසයේ දී පැවැත්වේ.

1980 වර්ෂයේ සිට පවත්වාගෙන එනු ලබන මෙම සම්මාන උලෙළ දශක තුනක් පුරා ශ්‍රී ලාංකේය තරුණ පරපුරේ දක්ෂතා ඇගයීමට ලක්කර ඇත. ශ්‍රී ලංකාවේ තරුණ පරපුර වෙනුවෙන් මෙවැනි සම්මාන උලෙළක් සංවිධානය කරන එකම ආයතනය JCI Sri Lanka සංවිධානයයි.

මෙම JCI ශ්‍රී ලංකා විශිෂ්ඨ තරුණ සම්මාන 2011 වැඩසටහන මගින් තම ක්ෂේත්‍රය තුල විශිෂ්ඨ දක්ෂතා දක්වන තරුණ පුද්ගලයින් හඳුනා ගනු ලබන අතර, ව්‍යාපාරික, මානව හිතවාදී සේවා, කැපීපෙනෙන නායකත්වය, වෛද්‍ය විද්‍යා සහ සංස්කෘතික යන පුළුල් විෂය පථ යටතේ සම්මාන 10ක් පිරිනැමේ.

"යුගයේ විශිෂ්ඨ තරුණ තරුණියන් හඳුනාගැනීමට අප කටයුතු සූදානම් කර ඇත. මේ සඳහා නාම යෝජනා බාර ගැනීම ආරම්භ කර ඇති බව සතුටින් දැනුම් දෙමි. වයස අවුරුදු 18ත් 40ත් අතර පුද්ගලයින්ගේ දක්ෂතා හඳුනාගැනීම සඳහා මාධ්‍යයක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙයි. ඒ තුලින් ඔවුන්ගේ දක්ෂතා හඳුනාගෙන හෙට දින නායකත්වයට පිය නැගීමට ඔවුන්ට දිරි දීම අපේ අභිප්‍රායයි" යනුවෙන් මේ පිළිබඳ අදහස් දක්වන ජූනියර් චේම්බර් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානයේ ගරු සභාපති ජිෆ්‍රී සුල්ෆර් මහතා කියා සිටියි.

'' මෙම තරුණ තරුණියන් ඇගයීම තුලින් ඔවුන් නියුතු ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයට ළඟා වීමටත් ඒ මගින් සමාජයට සේවය කිරීමටත් JCI සංවිධානය ඔවුන්ව උනන්දු කරවයි.'' තවදුරටත් මේ පිළිබඳ අදහස් දැක්වූ සුල්ෆර් මහතා මෙසේද කියා සිටියේය. ''මෙම සම්මාන උළෙල යහපත් සමාජයීය වගකීම තුලින් දියුණුවත්, සමාජයට යහපත් දායකත්වයක් ලබා දීමක් සඳහා වන දිගු ගමනකි.''

TOYP 2011 සාර්ථක කර ගැනීම සඳහා, ව්‍යාපාර ආයතන රැසක සහයෝගය JCI සංවිධානය වෙත ලැබී ඇත. තරුණ පෙළ ඇගයෙන මෙම ගෞරවාන්විත උළෙලට ඔවුන් එක් වන්නේ ඉමහත් සතුටිනි. රටෙහි තරුණ පරපුරට තම යහපත් අභිප්‍රායයන් මුදුන් පමුණුවා ගැනීමටත්, අන් අය හට උදාහරණයක් වීමටත් මෙය කදිම අවස්ථාවකි.

සම්මාන සඳහා ඉල්ලුම්පත් දිනපතා සහ සති අන්ත (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පුවත් පත් වල පළ වන අතර ඔබගේ නාම යෝජනා එම කූපනය පුරවා TOYP 2011 ලේකම් කාර්යාලය වෙත ලැබීමට සලස්වන්න.

සම්පූර්ණ කළ අයදුම් පත්‍ර 2011, ජූලි 29 දින හෝ එයට පෙර මෙම ලිපිනයට යොමු කරන්න. ''ව්‍යාපෘති සභාපති, TOYP ලේකම් කාර්යාලය, අංක 185/1, ධර්මපාල මාවත, කොළඹ 07.''

භාරගන්නා ලද අයදුම් පත් ඉහල පෙළේ තීරක මණ්ඩලයක් මගින්, විගණන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සම්මාන සඳහා සලකා බලනු ලැබේ. ජයග්‍රාහකයින් තෝරා ගැනීමේ ක්‍රමවේදය JCI දර්ශනයේ අන්තර්ගත ප්‍රතිපත්ති මත විශ්වාසය තබමින් අන්‍යයන් ධෛර්යවත් කෙරෙන සැලකිය යුතු දක්ෂතා මත පදනම් වේ.

අයදුම්පත් භාර ගැනෙන සාමාන්‍ය අංශ :

01. ව්‍යාපාර, ආර්ථික සහ/හෝ ව්‍යාපාරික නිපුණත්වය

02. දේශපාලනික, නෛතික සහ/හෝ රාජ්‍ය සම්බන්ධතා

03. ශාස්ත්‍රීය නායකත්වය සහ/හෝ නිපුණත්වය

04. සංස්කෘතික දක්ෂතා

05. සදාචාරය හෝ පාරිසරික නායකත්වය

06. දරුවන් වෙත දායකත්වය, ලෝක සාමය සහ/හෝ මානව හිමිකම්

07. මානව හිතවාදී සහ/හෝ ස්වෙච්චා නායකත්වය

08. විද්‍යාත්මක සහ/හෝ තාක්ෂණික සංවර්ධනය

09. පෞද්ගලික අභිවෘද්ධිය සහ/හෝ නිපුණත්වය

10. වෛද්‍ය ක්ෂේත්‍රයේ නව්‍යකරණයන්

JCI යනු තමන් හා ලෝකය දැකීමට අපේක්ෂා කරන ධනාත්මක වෙනස නිර්මාණය කිරීමට කැපවුනු වයස අවුරුදු 18ත් 40ත් අතර තරුණ ක්‍රියාශීලී පුරවැසියන්ගෙන් සමන්විත ලොවපුරා රටවල් 115ක විහිදී ඇති සමාජයකි.

1954 දී රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ආරම්භ වූ මෙම සංවිධානයේ මූලස්ථානය ඇමරිකා එක්සත් ජනපදයේ චෙස්ටර් ෆීල්ඩ් නගරයේ පිහිටා ඇත. තම උද්‍යෝග පාඨය වන "වඩා යහපත්" (Be Better) පෙර දැරි කරගෙන එහි සාමාජිකයෝ තම සමාජීය වගකීම පිළිබඳ මනා අවබෝධයකින් යුතුව වඩාත් යහපත් සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රියා කරති. කැපී පෙනෙන දක්ෂතා දැක්වූ සහ සමාජයේ ධනාත්මක වෙනසක් කල තරුණ ප්‍රජාව පිළිගැනීමට ලක් කිරීම ස්වකීය මෙහෙයක් ලෙස JCI සංවිධානය විශ්වාස කරයි.

ජූනියර් චේම්බර් ශ්‍රී ලංකා යනු ජූනියර් චේම්බර් ඉන්ටනැෂනල් හි දේශීය ශාඛාවය. ධනාත්මක වෙනස නිර්මාණය කිරීම පිණිස අවශ්‍ය සංවර්ධන අවස්ථාවලින් තරුණ පිරිස බලගැන්වීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වන ලෝකයේ තරුණ නායකත්ව සංවිධානය ලෙස ජූනියර් චේම්බර් ඉන්ටර්නැෂනල් හඳුන්වා දිය හැක.

ජූනියර් චේම්බර් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් TOYP 2011 වසරේ කැපී පෙනෙන තරුණ පුද්ගලයින් දස දෙනා ඇගයීමේ සම්මාන උලෙළ සංවිධානය කරන අතර මෙම සම්මාන ලොව පුරා රටවල ජාතික කමිටු මගින් ද එකී රටවල විශිෂ්ඨ තරුණ තරුණියන් හට ද ප්‍රධානය කරයි. බෙල්ජියමේ බ්‍රසල්ස් නුවරදී පැවැත්වෙන අන්තර් ජාතික සම්මාන උලෙල සඳහා ශ්‍රී ලංකා සම්මාන උලෙලේ ජයග්‍රාහකයින් 04 දෙනෙක් නම් කරුණු ලැබේ. TOYP සම්මාන පිළිබඳ මුල් අදහස ගෙන එනු ලැබුවේ 1930 දී ඇමරිකා එක්සත් ජනපදයේ JCI සංවිධානයේ සභාපති ඩර්වුඩ් හොවිස් (Durwood Howes) මහතාය. 1933 දී, මෙම වැඩසටහන නිල වශයෙන් එක්සත් ජනපදයේදී ක්‍රියාවට නංවන ලද අතර 1952 සිට අනෙකුත් රටවලද මෙම සම්මාන උලෙළ ජාතික මට්ටමින් සංවිධානය කරනු ලබයි.

TOYP 2011 නාම යෝජනා පත්‍රයෙහි පිටපත් www.jcisl.org වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.